# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2032/23 - 2017 අගෝස්තු මස 16 වැනි බදාදා - 2017.08.16

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

එල්.ඩී.බී. 21/1978 (x)

**1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනත**

25අ වන වගන්තිය යටතේ වූ නියමය

1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 25අ වන වගන්තිය මගින් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, උසස් අධ්‍යාපන සහ මහාමාර්ග අමාත්‍ය ලක්ෂ්මන් කිරිඇල්ල වන මා විසින්, ලියාපදිංචි අංක පී. වී. 64697 සහ 2007 අංක 7 දරන සමාගම් පනත යටතේ ශ්‍රී ලංකාවේ සංස්ථාගත කර ඇති සමාගමක් වන ශ්‍රී ලංකා ඉන්ස්ටිටියුට් ඔෆ් නැනෝ ටෙක්නොලජි (ප්‍රයිවට්) ලිමිටඩ් ආයතනය සම්බන්ධයෙන් ඉහත කී පනතේ 70ඇ වගන්තිය යටතේ වාර්තාවක් ලබා ගැනීමෙන් පසුව, මෙම නියමය මගින් සහ මෙහි I වන උපලේඛනයේ නිශ්චිතව දක්වා ඇති කොන්දේසිවලට යටත්ව, මෙහි පිළිවෙළින් II වන උපලේඛනයේ II වන තීරයේ වූ අනුරූප සටහන්වල නිශ්චිතව දක්වා ඇති කෙටි යෙදුම් සහිතව එකී උපලේඛනයේ I වන තීරයේ නිශ්චිතව දක්වා ඇති උපාධි ප්‍රදානය කිරීම සම්බන්ධයෙන් එහි උසස් අධ්‍යාපනය දියුණු කිරීමේ කාර්යය සඳහා වන උපාධි ප්‍රදානය කිරීමේ ආයතනයක් ලෙස ශ්‍රී ලංකා ඉන්ස්ටිටියුට් ඔෆ් නැනෝ ටෙක්නොලජි (ප්‍රයිවට්) ලිමිටඩ් ආයතනය පිළිගෙන සිටිමි.

***I වන උපලේඛනය***

***කොන්දේසි***

(මෙහි මින්මතු ''ආයතනය'' යනුවෙන් සඳහන් කරනු ලබන) ශ්‍රී ලංකා ඉන්ස්ටිටියුට් ඔෆ් නැනෝ ටෙක්නොලජි (ප්‍රයිවට්) ලිමිටඩ් ආයතනය, ශ්‍රී ලංකා යෝග්‍යතා මාර්ගෝපදේශනයෙහි නියම කරනු ලැබ ඇති පරිදි වූ අවම ඇතුළත් කර ගැනීමේ සුදුසුකම් සමග පහත දක්වා ඇති ලෙස අනුකූල විය යුතු ය -

(i) අදාළ ක්ෂේත්‍රයෙහි SLQF 6 මට්ටමෙහි ගෞරව උපාධියක්/විශේෂ උපාධියක් ; හෝ
(ii) ආශ්‍රිත ක්ෂේත්‍රයෙහි, SLQF 6 වන මට්ටමේ ගෞරව උපාධියක් සහ සුදුසුකම් ලැබීමේ පරීක්ෂණයක් සාර්ථකව සම්පූර්ණ කිරීම ; හෝ
(iii) අදාළ ක්ෂේත්‍රයෙහි, SLQF 7 වන මට්ටම හෝ ඊට ඉහළ සුදුසුකමක්.

***II වන උපලේඛනය***

| *I වන තීරය* | *II වන තීරය* |
|---|---|
| *උපාධිය* | *උපාධි සඳහා කෙටි යෙදුම්* |
| නැනෝ සහ උසස් තාක්ෂණය පිළිබඳ දර්ශනපති උපාධිය | එම්ෆිල් (නැනෝ සහ උසස් තාක්ෂණය) |

ලක්ෂ්මන් කිරිඇල්ල,
උසස් අධ්‍යාපන හා මහාමාර්ග අමාත්‍ය.

2017 අගෝස්තු මස 16 වැනි දින.
කොළඹ දී ය.

08 - 1058

1A - PG 3651 — 507 (2017/08) ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*